# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1660/30 - 2010 ජුනි 29 වැනි අඟහරුවාදා - 2010.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. – බී. 11/80.

1980 අංක 26 දරන ආහාර පනත

ආහාර ද්‍රව්‍ය සහ අයිතම ඇසිරීමේ නියෝග - 2010

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය ප්‍රකාරව ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
සෞඛ්‍ය අමාත්‍ය.

2010, ජුනි මස 09 වැනි දින,
කොළඹ,
සෞඛ්‍ය අමාත්‍යංශයේ දී ය.

නියෝග

1. මෙම නියෝග 2010 ආහාර (ඇසිරීමේ ද්‍රව්‍ය සහ අයිතම) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, එම නියෝග 2011 ජූලි මස 01 දින සිට බලාත්මක විය යුතු ය.

2. (1) සාමාන්‍ය සහ අපේක්ෂිත තත්ත්වයන් යටතේ –

*(අ)* මිනිස් සෞඛ්‍යයට හානිකරවන ;

*(ආ)* ආහාරවල සංඥානීය (organoleptic) ගති ලක්ෂණවල ක්ෂයවීමක් ඇතිකරවන ;

*(ඇ)* ආහාරවල ස්වභාවය, තත්ත්වය සහ ගුණාත්මක භාවය වෙනස් කරනු ලබන

යම් ආහාර ඇසුරුම් ද්‍රව්‍ය හෝ අයිතමයන් කිසිම තැනැත්තකු විසින් ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, ප්‍රවාහනය කිරීම, අලෙවිය සඳහා ප්‍රචාරය කිරීම, අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම, විකිණීම, ඇසුරුම් කිරීම, ගබඩා කිරීම, පාවිච්චි කිරීම හෝ බෙදා හැරීම නොකළ යුතු ය.

1A - G 13062 — 3,830 (2010/06)

(2) ආහාර ඇසුරුම් කිරීම සඳහා භාවිත කිරීමට අදහස් කරනු ලබන යම් ද්‍රව්‍ය හෝ අයිතම නිෂ්පාදනය කරනු ලබන හෝ ආනයනය කරනු ලබන සෑම තැනැත්තකුම එම ඇසුරුම් මත –

*(අ)* ''ආහාර සඳහා භාවිත කිරීම පිණිස" යන වචන හෝ යම් අදාළ වචන හෝ 1 වැනි උපලේඛනයේ සඳහන් නම් කරන ලද සංකේතයක් ;

*(ආ)* ඒවා භාවිත කිරීමේ දී අනුගමනය කළ යුතු යම් විශේෂිත තත්වයන් ; සහ

*(ඇ)* නිෂ්පාදකයාගේ නම සහ ලිපිනය හෝ ලියාපදිංචි වෙළඳ ලකුණ;

මුද්‍රණයකර ඇති බවට සහතික විය යුතු ය.

(3) ආහාර ඇසුරුම් කිරීම සඳහා භාවිතා කිරීමට යොදනු ලබන යම් ද්‍රව්‍ය හෝ අයිතම නිෂ්පාදනය කරනු ලබන හෝ ආනයනය කරනු ලබන සෑම තැනැත්තෙකුම එම නිෂ්පාදනය සඳහා භාවිතා කරන ලද අමුද්‍රව්‍ය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව අවශ්‍ය කරන ගුණාත්මක තත්ත්වයෙන් හෝ මට්ටමින් පවතින බවට එම නිෂ්පාදකයන් සහතික විය යුතු අතර අසුරන ද්‍රව්‍ය හෝ අයිතම ආහාර සඳහා අනුමත තත්ත්වයේ බවට සහතික විය යුතු ය.

(4) යම් ප්ලාස්ටික් ලැමිනේට් ද්‍රව්‍ය ආහාර ඇසුරුම් කිරීම සඳහා භාවිත කරනු ලබන අවස්ථාවක දී, ඇලවුම් ද්‍රව්‍ය සහ තීන්ත ද ඇතුලුව එම සියලු ලැමිනේට් ද්‍රව්‍ය උපාංග ආහාර සඳහා අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූල බවට එක් එක් තනි උපාංගයෙහි නිෂ්පාදකයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

3\. (1) කිසිම තැනැත්තකු විසින් –

*(අ)* එනමල් හෝ ඔපදමන ලද මැටි බඳුන්වලින් සකස් කරන ලද යම් ද්‍රව්‍ය හෝ අයිතමවල අසුරන ලද, සකස් කරන ලද, ගබඩා කරන ලද, බෙදා හරින ලද හෝ තබා ඇති යම් ආහාර ද්‍රව්‍යවලට ඊයම්, ඇන්ටිමනි, ආසනික්, කැඩ්මියම් මූලද්‍රව්‍ය හෝ වෙනත් විෂ ද්‍රව්‍ය කාන්දු නොවන බවට මෙහි උපලේඛන II හි විස්තරකර ඇති පරීක්ෂණවල, පරාමිතීන් සමග සැහීමකට පත් නොවන හා අම්ල ප්‍රතිරෝධී නොවන යම් අසුරණ ද්‍රව්‍ය හෝ අයිතම ;

*(ආ)* විනයිල් ක්ලෝරයිඩ් ඒක අවයව (Monomer) 1 මි.ග්‍රෑ./කි.ග්‍රෑ. වඩා වැඩි ප්‍රමාණයන් අන්තර්ගත යම් ඝණ හෝ අර්ධ ඝණ පොලිවිනිල් ක්ලෝරයිඩ්වලින් සාදන ලද යම් ඇසුරුම් ද්‍රව්‍ය හෝ අයිතම හෝ යම් භාජනවල අලෙවිය සඳහා අසුරා ඇති, ගබඩාකර ඇති, බෙදාහරිනු ලබන හෝ අලෙවිය සඳහා විවෘතව ඇති යම් ආහාර ද්‍රව්‍ය ;

*(ඇ)* විනිල් ක්ලෝරයිඩ් ඒක අවයව (Monomer) ප්‍රමාණය 0.05 මි.ග්‍රෑ./කි.ග්‍රෑ. වඩා වැඩිවන ප්‍රමාණයක් අන්තර්ගත යම් ආහාර ද්‍රව්‍ය;

*(ඈ)* යම් හානි වූ ඇසුරුමක හෝ බහාලුමක අසුරන ලද, ගබඩා කරන ලද, බෙදාහරින ලද හෝ අලෙවිය සඳහා ප්‍රදර්ශනය කරනු ලබන යම් ආහාර ද්‍රව්‍ය

ආනයනය කිරීම, නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ විකිණීම සඳහා ප්‍රචාරය කිරීම, අලෙවිය සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම, ඇසුරුම් කිරීම, ගබඩා කිරීම, පාවිච්චි කිරීම, බෙදාදීම හෝ බෙදාහැරීම නොකළ යුතු ය.

(2) මෙම නියෝගවල (1) වැනි ඡේදයේ *(ඈ)* උපඡේදයේ කාර්ය සඳහා "හානි වූ" යන්නට –

*(අ)* ඇසුරුමෙහි හෝ බහාලුමෙහි සම්පූර්ණභාවය හෝ නිෂ්පාදිතයේ යහපත්භාවය හෝ එම කරුණු දෙකටම බලපානු ලබන යම් පලුදුවීමක් හෝ විකෘතිවීමක් ; හෝ

*(ආ)* ඇසුරුමෙහි හෝ බහාලුමෙහි යම් සිදුරුවීමක් හෝ මලබැඳීමක් හෝ කාන්දුවීමක් හෝ එම කරුණු වල සංයුක්තවීමක් සිදුවීම

අදහස් වේ.

4. කිසිම තැනැත්තකු විසින් —

(අ) නැවුම් බව රඳවාගැනීම සඳහා නැවුම් පළතුරු මත යම් විනිල් ක්ලෝරයිඩ් ප්ලාස්ටික් තැවරුමක් ආලේප කිරීම ; හෝ

(ආ) විකිණීම සඳහා ආහාර අසුරා ඇති, ගබඩාකර ඇති, බෙදාහරින හෝ ඉදිරිපත්කර ඇති යම් ඇසුරුමක් වශයෙන් වූ ඇක්‍රිලොනිට්‍රයිල් (Acrylonitrile) වලින් සාදන ලද හෝ අන්තර්ගත යම් බෝතලයක්, පෙට්ටියක් හෝ වෙනත් යම් ඇසුරුමක්,

භාවිත කිරීම හෝ භාවිත කිරීමට සැලැස්වීම හෝ භාවිත කිරීමට අවසර දීම නොකළ යුතු ය.

5. (1) කිසිම තැනැත්තකු විසින් —

(අ) යම් ආහාර නොවන නිෂ්පාදිතයක් සඳහා භාවිත කර ඇති හෝ භාවිත කර ඇති ලෙස අදහස් කරනු ලබන, යම් ඇසුරුම් ද්‍රව්‍ය, දවටන, බහාලුම් හෝ භාජන කිසිවක් ආහාර සකස් කිරීම, ඇසිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම හෝ අලෙවිය සඳහා ඉදිරිපත් කිරීමට ;

(ආ) වෙනත් යම් කාර්යයක් සඳහා කලින් භාවිතාකර ඇති යම් ගෝනියක් හෝ බහාලුමක් සීනි හෝ පිටි ඇසිරීම, ගබඩා කිරීම සහ අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම සඳහා;

(ඇ) වෙනත් යම් කාර්යයක් සඳහා කලින් භාවිත කරනු ලැබ ඇති ටැන්කි සහ සයිලොස් හැර යම් බෝතල් හෝ ලෝහ බහාලුම් කෑමට සුදුසු තෙල් සහ මේද සකස් කිරීම, ඇසිරීම, ගබඩා කිරීම, බෙදාදීම හෝ අලෙවිය සඳහා ඉදිරිපත් කිරීමට;

(ඈ) ආහාරයක් වෙනත් යම් ආහාර සඳහා නිර්දේශිත අමතර ආවරණයකින් අසුරා ඇත්නම් මිස, වෙනත් කාර්යයක් සඳහා කලින් භාවිතකර ඇති යම් ප්ලාස්ටික් බහාලුමක් ආහාර සකස් කිරීම, ඇසිරීම, ගබඩා කිරීම, බෙදාදීම හෝ අලෙවිය සඳහා ඉදිරිපත් කිරීමට;

(ඉ) වෙනත් යම් ආහාර සඳහා කලින් භාවිතකර ඇති යම් ගෝනි උරයක් හෝ පොලිතින් උරයක් සහල් සකස් කිරීම, ඇසිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම සඳහා;

(ඊ) පානීය ජලය සඳහා පමණක් කලින් භාවිත කර ඇති ප්‍රමාණයෙන් ලීටර් දහ අටකට (18) අඩු නොවන පානීය ජලය බෝතල් කරන ලද යම් බහාලුමක් හැර කලින් භාවිත කර ඇති බහාලුවක්;

(උ) යම් ආහාර ඇසිරීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රතිචක්‍රීයකරණය කරන ලද ප්ලාස්ටික් වලින් සාදන ලද ඇසුරුමක්, උපකරණයක්, බහාලුමක් හෝ භාජනයක්;

භාවිත කිරීම හෝ භාවිත කිරීමට සැලැස්වීම හෝ අවසර දීම නොකළ යුතු ය.

(2) එළවලු ගබඩා කිරීම හෝ ඇසිරීම සඳහා කලින් භාවිත කර ඇති යම් පෙට්ටියක් හෝ ලෑලි පෙට්ටියක් පළතුරු ඇසිරීම සහ ගබඩා කිරීම සඳහා භාවිත කළ හැකි අතර නැවත එය ප්‍රතිවිරුද්ධ පිළිවෙලට ද භාවිත කළ හැකි ය.

6. 5 වැනි නියෝගයෙහි කාර්ය සඳහා, ආහාර අන්තර්ගත යම් ඇසුරුම් ද්‍රව්‍යයක් හෝ දෙයක් සඳහා වෙනත් යම් ආහාර වර්ගයකට අයත් ලකුණක් හෝ ලේබලයක් දරනු ලබන අවස්ථාවක දී, එම ඇසුරුම් ද්‍රව්‍ය හෝ දේ එකී ලකුණ හෝ ලේබලය මගින් පෙන්වා ඇති එකී නිශ්චිත ආහාර වර්ගය සඳහා භාවිත කර ඇති ලෙස උපකල්පනය කරනු ලැබිය යුතු ය.

7. (1) අලෙවිය සඳහා ඉදිරිපත්කර ඇති යම් ආහාර ද්‍රව්‍යයක හෝ එකී ආහාර ද්‍රව්‍ය අඩංගු ඇසුරුම තුළ කිසිම තැනැත්තකු විසින් කිසිම සෙල්ලම් බඩුවක්, කාසියක් හෝ වෙනත් යම් අයිතමයක් නොතැබිය යුතු ය.

එසේ වුව ද, එකී ආහාර ද්‍රව්‍ය සමග හෝ එකී ආහාර ද්‍රව්‍ය අන්තර්ගත ඇසුරුම් තුළ යම් තැනැත්තකු පහත සඳහන් දෑ තබනු ලැබිය හැකි ය :-

(අ) එම ද්‍රව්‍ය විෂබීජවලින් තොර වන්නේ නම් පමණක් පරිභෝජනය කළයුතු ආහාරවල නිර්දේශිත ප්‍රමාණය මැනගැනීම සඳහා වූ යම් ද්‍රව්‍යයක් තබනු ලැබිය හැකිය ;

(ආ) සෘජු පරිභෝජනය සඳහා සූදානම් ආහාර ද්‍රව්‍ය සෘජු ලෙස ස්පර්ශ නොවන හෝ ස්පර්ශ වීමක් සිදුවිය නොහැකි ආකාරයෙන් අභ්‍යන්තර විනිවිද පෙනෙන දවටනයක් මගින් සම්පූර්ණයෙන්ම වසා දමා ඇත්නම් පමණක් යම් පැහැදිලි, අභ්‍යන්තර ලෙබලයක් තබනු ලැබිය හැකි ය ;

*(ඇ)* ඔක්සිජන් අවශෝෂණය කරගැනීමේ කාර්ය සඳහා ඔක්සිහරණය කරන ලද යකඩ කුඩු සහිත යම් කුඩා ඇසුරුමක් තබනු ලැබිය හැකි ය.

(2) මෙම නියෝගයෙහි (1) වැනි ඡේදයේ *(ඇ)* උපඡේදයේ නිශ්චිතව දක්වා ඇති ඔක්සිහරණය කරන ලද යකඩ කුඩු ආහාර දූහනය නොකරන, පැල්ලම් ඇති නොකරන හෝ ආහාරවලට සංක්‍රමණය නොවන ආකාරයට කුඩා ඇසුරුමක බහාලනු ලැබිය යුතු ය.

(3) ඔක්සිහරණය කරන ලද යකඩ කුඩු සහිත කුඩා ඇසුරුම ආහාර සමග සෘජුව ම ස්පර්ශවන අවස්ථාවක දී, කුඩා ඇසුරුම සහ එහි ලේබලය ආහාර දූහනය නොකරන පැල්ලම් ඇති නොකරන හෝ ආහාරවලට සංක්‍රමණය නොවන ද්‍රව්‍යයකින් සකස් කරනු ලැබිය යුතු ය.

(4) ඔක්සිහරණය කරන ලද යකඩ කුඩු සහිත කුඩා ඇසුරුම මෙම නියෝගවල III වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අයිතමයන් එකක් හෝ වැඩි ගණනකින් සමන්විත විය හැකි ය.

(5) ඔක්සිහරණය කරන ලද යකඩ කුඩු ඇසුරුම මත "ඔක්සිජන් අවශෝෂකය" යන වචනය හෝ සමාන තේරුම් සහිත වචනයක් හෝ වචන, දවටනයේ සඳහන් කළ යුතු අතර "අන්තර්ගත කොටස් ආහාරයට නොගන්න" සහ "යකඩ කුඩු අන්තර්ගතයි" යන යෙදුම් යෙදිය යුතු ය.

8. ආහාර ඇසුරුම් කිරීමේ හෝ ගබඩා කිරීමේ ව්‍යාපාරයෙහි යෙදී සිටින කිසිම තැනැත්තකු විසින් 1980 අංක 26 දරන ආහාර පනත යටතේ සාදන ලද අංක 1376/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2005 ආහාර (ලේබල් කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ) නියෝග සහ එහි සංශෝධන, ප්‍රතිශෝධන ප්‍රකාරව සහ ආදේශන ලේබල්කර ඇත්තා වූ යම් ඇසුරුමක් හෝ බහාලුමක් තුළ හැර වෙනත් ඇසුරුමක හෝ බහාලුමක ඇසිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතු ය.

9. 1980 අංක 26 දරන ආහාර පනත යටතේ සාදන ලද 1993 ඔක්තෝබර් මස 14 වැනි දින අංක 788/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1993 ආහාර (ලේබල් කිරීමේ සහ විවිධ විධිවිධාන) නියෝගවල 25 වැනි නියෝගය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවන්නේ නම් මිස මෙම නියෝගවල –

"ඇසුරුම් ද්‍රව්‍ය සහ අයිතම" යන්නට යම් ඇසුරුමක්, උපකරණයක්, බහාලුමක් හෝ භාජනයක් ඇතුලත් වේ.

I වැනි උපලේඛනය

[2 (2) වැනි නියෝගය]



II වැනි උපලේඛනය

***ඇසුරුම් පරීක්ෂා කිරීම***

***(අ) ආහාර ගබඩා කිරීම සඳහා භාවිතකර ඇති ඇසුරුම්, උපකරණ, බහාලුම් සහ භාජන සම්බන්ධ පරීක්ෂා කිරීම***

(1) ***සකස් කිරීම :***

පරීක්ෂාවට භාජනය කළ යුතු ආවරණ ද්‍රව්‍ය පිරිසිදු කාරක (detergent) අන්තර්ගත ජලයෙන් සෝදා අනතුරුව පිරිසිදු ජලයෙන් සෝදනු ලැබිය යුතු ය. ඉන්පසු පරීක්ෂා කළයුතු මතුපිට අතින් පිරි නොමැදිය යුතු ය. මතුපිට ඉතිරිවන ජලය ඉවත් කිරීමට නිස්සාරක ද්‍රාවණයවන පරිමාව අනුව සියයට 4ක් ඇසිටික් අම්ලය අඩංගු ජලයෙන් සේදිය යුතුය.

(2) ***පරීක්ෂාකර බැලීම :***

නිස්සාරක දියරයෙන් කාමර උෂ්ණත්වයේ දී අදාළ භාජනය සම්පූර්ණයෙන්ම පිරවිය යුතු ය. බාහිර ද්‍රව්‍ය එකතුවීම අවමකර ගැනීම සඳහා නිස්සාරක ද්‍රාවණය ආවරණය කරනු ලැබිය යුතු අතර, එය පැය 24ක කාලයක් කාමර උෂ්ණත්වයේ තැබිය යුතු ය.

පැය 24ක කාලසීමාවෙන් පසුව, නිස්සාරක ද්‍රාවණය හොඳින් සෙලවිය යුතු අතර ඉන් කොටසක් විශ්ලේෂණ සඳහා ඉවත් කරනු ලැබිය යුතු ය.

නිස්සාරක ද්‍රාවණය තුල ඇන්ටිමනි, ආසනික්, කැඩ්මියම් හෝ ඊයම් දසලක්ෂයට කොටස්වලින් (මිග්‍රෑ/කිග්‍රෑ) දක්වා ඇති පහත දැක්වෙන ප්‍රමාණවලට වඩා වැඩි නොවිය යුතු ය.

| ඇන්ටිමනි | ආසනික් | කැඩ්මියම් | ඊයම් |
|---|---|---|---|
| 0.2 | 0.2 | 0.2 | 0.2 |

*(ආ) ආහාර පිසීම සඳහා භාවිත කරනු ලබන ඇසුරුම්, උපකරණ, බහාලුම් සහ භාජන පරීක්ෂා කිරීම*

1. *සකස් කිරීම :*
   ඉහත 'අ' හි සඳහන් ආකාරයට

2. *පරීක්ෂා කිරීම :*

අදාළ ද්‍රව්‍ය $120^0C$ දක්වා රත්කර නිස්සාරක ද්‍රාවණය (ඇසිටික් අම්ලය සියයට 4ක ජලීය, ද්‍රාවනය) එහි සක්‍රීය කොටසින් තුනෙන් දෙකක් පිරෙනතෙක් භාජනයට දැමිය යුතු ය. භාජනය එහි පියනක් ඇත්නම් එම පියනෙන් ආවරණය කරනු ලැබිය යුතු අතර, නිස්සාරක ද්‍රාවණය පැය 2ක කාලයක් සෙමින් නටමින් පැවතිය යුතු ය. ස්පර්ශවන ප්‍රදේශය අඩු නොවන බවට, සහතික වීම සඳහා නිස්සාරක ද්‍රාවණය ස්වල්පයක් විටින් විට එකතුකරනු ලැබිය යුතු අතර, ඉන්පසු භාජනය පැය 22ක කාලයක් කාමර උෂ්ණත්වයේ තැබිය යුතු ය.

පැය 22ක කාලයෙන් පසුව නිස්සාරක ද්‍රාවණය භාජනයේ ප්‍රමාණයෙන් තුනෙන් දෙකක් දක්වා වැසී යාම සඳහා එකතු කරනු ලැබිය යුතු ය. ද්‍රාවණ මිශ්‍ර කිරීමකින් පසුව නිස්සාරක ද්‍රාවණයෙන් යම් කොටසක් විශ්ලේෂණ සඳහා ඉවත් කරනු ලැබිය යුතු ය.

එම නිස්සාරක ද්‍රාවණය තුල ඇන්ටිමනි, ආසනික්, කැඩියම් හෝ ඊයම් දශ ලක්ෂයට කොටස්වලින් දක්වා ඇති පහත දැක්වෙන ප්‍රමාණ වලට වඩා වැඩි නොවිය යුතු ය.

| ඇන්ටිමනි | ආසනික් | කැඩ්මියම් | ඊයම් |
|---|---|---|---|
| 0.7 | 0.7 | 0.7 | 0.7 |

රෙගුලාසි 7(4)

III වැනි උපලේඛනය

ඔක්සිහරණය කරන ලද යකඩ කුඩු අඩංගු පැකැට්ටුව තුල අඩංගු දෑ.

*(අ)* කැල්සියම් ක්ලෝරයිඩ්,

*(ආ)* කැල්සියම් හයිඩ්‍රොක්සයිඩ්,

*(ඇ)* සක්‍රිය කාබන්,

*(ඈ)* ජිප්සම්

*(ඉ)* යකඩ ඔක්සයිඩ්,

*(ඊ)* මැග්නීසියම් හයිඩ්‍රොක්සයිඩ්,

*(උ)* මැග්නීසියම් ස්ටියරේට්

*(ඌ)* පර්ලයිට්,

*(එ)* සාමාන්‍ය ලුණු,

*(ඒ)* ටැල්ක්,

*(ඔ)* සියොලයිට්.

07-426

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.